CPA

Centre for Policy Alternatives

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

# ලුහුඬු මාර්ගෝපදේශ 1

# කොවිඩ්-19 වෛයිරස් වසංගත පසුබිම තුළ ඉස්මතු වන නෛතිකමය ගැටළු

ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්තවෙමින් පවතින කොවිඩ්-19 වෛරසයේ බලපෑම් ඇති පසුබිම තුළ උද්ගතවන නෛතික ගැටළු ගණනාවක් සහ ඒවායෙහි ප්‍රතිවිපාකයන් සම්බන්ධයෙන් වන තත්ත්වය පෙන්වා දීම උදේසා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මෙම ලුහුඬු මාර්ගොපදේශය සකසා තිබේ. කොවිඩ් 19 වෛරසයේ ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකාව විසින් පසුගිය සති කීපය තුළ කඩිනම් පියවර ගෙන තිබේ. වර්ෂ 2020 මාර්තු මස 02 වන දින ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ විසින් පාර්ලිමේන්තුව විසුරුහැර ඇති පසුබිමක් තුළ ඉහත කී පියවරයන් ගෙන තිබේ. මෙකී වෛරසයෙහි ව්‍යාපත්වීම මැඩපැවත්වීම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කරන්නා වූ සියලුදෙනාගේ කාර්යභාරයන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් පිළිගන්නා අතරම, පවතින වර්තමාන හදිසි සෞඛ්‍ය තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීමේ දී ආණ්ඩු පාලනය සහ අයිතිවාසිකම් සම්බන්ධයෙන් වැඩි වශයෙන් ඉස්මතු වන ගැටළුකාරී තත්ත්වයන් මෙම සටහන මගින් පෙන්වා දෙනු ලැබේ. මෙම ලුහුඬු මාර්ගෝපදේශය හරහා ඉස්මතු කරනු ලබන කරුනු මගින් අපේක්ෂා කරනු ලබන්නේ අදාළ අධිකාරීත්වය ලත් ආයතන සමඟ අර්ථාන්විත ආකාරයකින් එකිනෙක එක්ව කටයුතු කර කොවිඩ් 19 වසංගතය සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් ඉටුකරනු ලබන කාර්යයන් කාර්යක්‍ෂමව, නීත්‍යානුකූලව සහ ව්‍යවසථානුකූලව සිදු වන බව තහවුරු කිරීමයි. මෙම වෛරසය ව්‍යාප්ත වීම පාලනය කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී එකී සියලු ක්‍රියාමාර්ග නීතියේ ආධිපත්‍ය තහවුරු වන ආකාරයට සහ ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල තත්ත්වයන්ට අනුගතව සිදුවන ලෙසට තහවුරු කිරීමේ වැදගත්කම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් අවධාරණය කරනු ලැබේ.

## විධායක සාරාංශය

මෙහිදී මූලික වශයෙන්ම අවාධානය යොමු කරනු ලබන්නේ පාර්ලිමේන්තු මහ මැතිවරණය කල් දැමීම සම්බන්ධයෙනි. කොවිඩ්-19 වෛරසය පිළිබඳව හදිසි සෞඛ්‍ය තත්ත්වයක් ශ්‍රී ලංකාව තුළ උද්ගතව නොමැති අවස්ථාවක, එනම් වර්ෂ 2020 මාර්තු 02 වන දින පාර්ලිමේන්තුව විසුරුවා හරින ලදි. කෙසේ නමුත්, වෛරසය ආසාදනය වුවන්ගෙන් සංඛ්‍යාත්මක ඉහළ යාමත් සමඟ මැතිවරණය කල් දැමීමේ තීරණයට එළැඹෙන ලදි. මෙහිදි විශේෂයෙන්ම සඳහන් කල යුතු කරණු වන්නේ පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ ගැසට් නිවේදනය ඉවත් කර ගැනීම / ආපසු කැඳවීම කිරීම සඳහා ජනාධිපතිවරයාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ හෝ පාර්ලිමේන්තු මැතිවරණ පනත යටතේ කිසිදු අවහිරතාවයක් නොමැති බවයි.

මාර්තු 19 වන දින  මැතිවරණය සඳහා නාම යෝජනා භාරගැනීම නිම කිරීමත් සමඟම පාර්ලිමේන්තු

මහ මැතිවරණය කල්දැමීමට මැතිවරණ කොමිෂන් සභාව තිරණය කරන ලදි. එවන් වු පසුබිමක මැතිවරණය නැවත කෙදිනක පැවැත්වේද යන්න පිළිබඳව අවිනිශ්චිතභාවය ද සහිතව පාර්ලිමේන්තුව විසුරවු තත්ත්වය දිගටම පවතී. තවද, මාර්තු මස 2 වන දින නිකුත් කල ගැස්ට් නිවේදනය ප්‍රකාරව ''නව පාර්ලිමේන්තුව වර්ෂ 2020 මැයි මස 14 වන දින රැස්වේ'' යැයි සඳහන් වුවද, එකී දිනයෙහි රැස්වීම සඳහා පාර්ලිමේන්තුවක් එදිනට පවතින්නේ නැති බවද සඳහන් කළ යුතුය.

පාර්ලිමේන්තුව විසුරුවා හැරීම සහ ඒ ආශ්‍රිතව පැනනගින සංකීර්ණ ගැටළුකාරී තත්ත්වයන් පිළිබඳ තත්ත්වය විමසීමට ලක් කිරීමද මෙම මාර්ගෝපදේශය මඟින් සිදු කෙරේ. මැතිවරණය කල්දැමීම සම්බන්ධයෙන් මැතිවරණ කොමිසමටද ඉතා අල්ප වූ විකල්ප අවස්ථාවන් ඇති පසුබිමක වුවද එකී තීරණය මඟින් පුරවැසියන්ගේ මුලික අයිතිවාසිකම් කෙරේ බලපෑමක් උද්ගත කර තිබේ. මෙහිදි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මඟින් පෙන්වා දෙනු ලබන්නේ ජනාධිපතිවරයා විසින් වර්ෂ 2020 මාර්තු මස 02 වන දින නිකුත් කළ ගැසට් නිවේදනය ආපසු කැඳවීමක් කළේ නම්, පැවැති පාර්ලිමේන්තුව වර්ෂ 2020 අගොස්තු අවසානය දක්වා ක්‍රියාත්මකව පැවැතීමට හැකියාව තිබු බවයි.

ක්‍රියාකාරී පාර්ලිමේන්තුවක් නොමැති තත්ත්වයක් තුළ උද්ගත වන්නා වු අහිතකර ප්‍රතිවිපාකයන් කීපයක් පිළිබඳව මෙහිදී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මඟින් අවධානය යොමු කරනු ලැබේ. ශ්‍රේෂ්ඨාධිකරණය මඟින් ලබා දී ඇති තීන්දු ගණනාවකද අවධාරණය කර ඇති පරිදි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව අනුව රාජ්‍ය මුදල් පාලනය සම්බන්ධයෙන් සම්පූර්ණ වගකීම ඇත්තේ පාර්ලිමේන්තුවටය. ක්‍රියාකාරී පාර්ලිමේන්තුවක් නොමැති කල්හි, විසර්ජන පනත් හරහා ජනාධිපතිවරයාට මුදල් වෙන් කිරීම් කටයුතු සම්බන්ධයෙන් ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි සීමාවන් පිළිබඳ අවම අධීක්ෂණය ද ඇතුළුව බරපතල අහිතකර ප්‍රතිවිපාකයන් ගණනාවක්ම උද්ගත වේ. එමෙන්ම, මෙතුලින් කිසිදු සංවරණ හා තුලන තත්ත්වයක් නොමැතිව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් අපේක්ෂිත හරයාත්මක මුලධර්මයන්ට  ද ප්‍රතිවිරුද්ධව රාජ්‍ය මුදල් සම්බන්ධයෙන් නියාමනය නොකල පාලන හැකියාව විධායකය වෙත ලබාදිය හැකි වේ. පවතින හදිසි තත්ත්වයට මුහුණ දිමේදී කාර්යක්ෂමතාවය මෙන්ම අණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකුලභාය ද තහවුරු කිරීම පිණිස අවශ්‍ය මුදල් ප්‍රතිපාදන අනුමත කිරීම සඳහා පාර්ලිමේන්තුව වහාම කැඳවීම ඉතාම වැදගත් අවශ්‍යතාවයකි.

විවිධාකාර ව්‍යසන තත්ත්වයන් මැඩ පැවැත්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සතුව දශක ගණනාවක අත්දැකීම් පැවැතියද, කොවිඩ් - 19  වෛරසය තත්ත්වය මඟින් මින් පෙර නොදුටුවිරූ අන්දමේ අභියෝගයක් උද්ගතව ඇත්තේ ඒ සඳහා අවශ්‍ය නව ක්‍රමවේදයන්/ව්‍යුහයන් වල අවශ්‍යතාවය ද ඉස්මතු කරමිනි. ක්‍රියාකාරී පාර්ලිමේන්තුවක් නොමැති පසුබිමක මෙකී කාර්ය කර්තව්‍යයන් සිදු කරනු ලබන්නේ කවර ආකාරයකින්ද යන්න සම්බන්ධයෙන් ද ගැටළුකාරී තත්ත්වයක් උද්ගත කරනු ලැබේ. එපමණක් නොව,  පවතින හදිසි තත්ත්වය කළමණාකරණය කිරීම සඳහා භාවිතා කළ හැකි යාන්ත්‍රණයන් ගණනාවක්ම ක්‍රියාවට නැංවීමේ හැකියාව අණ්ඩුවට නොලැබී තිබීමද පාර්ලිමේන්තුව නොකැදවීම හේතුවෙන් උද්ගතව ඇති තවත් හතක් ප්‍රධාන අහිතකර තත්ත්වයකි.

හදිසි තත්ත්වයක් සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීමේදී ඉතා තීරණාත්මක වැදගත් කාර්යභාරයක් පාර්ලිමේන්තුව සතුව පවතින අතර ආණ්ඩුවේ විවිධ අංශයන් අදාළ හදිසි තත්ත්වයන්ට කාර්යක්ෂමව මුහුණ දෙන්නා සේම එකී කාර්ය කාර්තව්‍යයන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සහ නීතියේ ආධිපත්‍යයට අනුකුලවද සිදුවන බව තහවුරු කිරීම ඉතා වැදගත් සාධකයකි. මෙම මාර්ගෝපදේශ ලියවිල්ලද මඟින් දීර්ඝව සාකච්ඡාවට බඳුන් කෙරෙන මෙකී සෑම සියලු ගැටළුකාරී තත්ත්වයන් සඳහා කඩිනමින් අවධානය යොමු කල යුතු වන්නේ පවතින හදිසි තත්ත්වයට මුහුණ දිමේදී ශ්‍රී ලංකාව ස්වකීය ක්‍රියාමාර්ගයන් ඵලදායී ලෙසත් ස්ථිර වූ මෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය රාමුව තුළ සිදු කෙරෙන බවත් තහවුරු කිරීම උදෙසාය. මේ සම්බන්ධයෙන් ක්‍රියාකිරීම සහ/හෝ ක්‍රියාත්මක වීමට ඇති අකැමැත්ත මඟින් දිගුකාලීනව බරපතල අහිතකර ප්‍රතිවිපාකයන් මුහුණ දීමට සිදුවනු ඇත.

**පසුබිම**

වර්ෂ 2020 මාර්තු මස 02 වන දින ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ විසින් පාර්ලිමේන්තුව විසුරුවා හරිමින් ගැසට් නිවේදනය නිකුත් කරන ලදි.[1] මෙකී නිවේදනය ප්‍රකාරව;

i) වර්ෂ 2020 මාර්තු 02 වන දින මධ්‍යම රාත්‍රී සිට බලපැවැත්වෙන පරිදි පාර්ලිමේන්තුව විසුරුවා හැරේ;

ii) පාර්ලිමේන්තු මහ මැතිවරණය වර්ෂ 2020 අප්‍රේල් මස 25 වන දින පැවැත්වේ;

iii) වර්ෂ 2020 මාර්තු 12 වන දින සිට 2020 මාර්තු 19 වන දින මධ්‍යාහන 12 තෙක් වන කාල පරාසය තුල පාර්ලිමේන්තු මහ මැතිවරණය සඳහා නාම යෝජනා භාර ගනු ලැබේ; සහ

iv) වර්ෂ 2020 මැයි මස 14 වන දින අභිනව පාර්ලිමේන්තුව රැස්වේ.

තමාට ලැබෙන පළමු අවස්ථාවේදීම, එනම් වර්ෂ 2015 අගෝස්තු මස තෝරාපත් කරගත් පාර්ලිමේන්තුවෙහි පස් අවුරුදු කාල සීමාවෙන් වසර හතරක් සහ මාස හයක් සම්පූර්ණ කල පසුව එළැඹෙන දිනයේදී පාර්ලිමේන්තුව විසුරුවන ස්ථාවරයෙහි ජනාධිපතිවරයා වර්ෂ 2019 දෙසැම්බර් මාසය සිටම සිටින ලදි. ඔහු විසින් පාර්ලිමේන්තුව විසුරුවන ලද අවස්ථාව වන විට ශ්‍රී ලංකාව තුල කොවිඩ්-19 වෛරසය ආසාදනය වූ රෝගීන් නොසිටි මුත්, එය චීනය, යුරෝපය සහ නැගෙනහිර අසියාකරයෙහි බොහෝ රටවල් වල වර්ධනය වෙමින් පැවැති අර්බුදයක් විය.

ශ්‍රී ලංකික පුරවැසියෙකුට කොවිඩ්-19 වෛරසය ආසාදනය වී ඇති බව ප්‍රථම වතාවට තහවුරු වුයේ 2020 මාර්තු 11 වන දින වන අතර 2020 මාර්තු 18 වන දින වන විට එකී ආසාදිත සංඛ්‍යාව 53[2] දක්වා ඉහළ ගොස් තිබුණි. මෙම කාල පරාසය තුළදී සමහර දේශපාලන පක්ෂ සහ මැතිවරණ නිරීක්ෂණ ආයතන මඟින් මෙම වෛරස් රෝගී තත්ත්වය තුලින් උද්ගතව ඇති තර්ජනය පහව යන තෙක් මාස කීපයකට පාර්ලිමේන්තු මැතිවරණය කල් දමන ලෙසට ඉල්ලීම් ඉදිරිපත් කෙරුණි.[3]

තවද, 2020 මාර්තු 16 වන දින රජයේ නිවාඩු දිනයක් වශයෙන් ප්‍රකාශයට පත් කර 17 සිට 19 වන දිනය තෙක් කාල පරාසය ''විශේෂ නිවාඩු'' දින වශයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දේ සහ තවත් පියවරයන් කීපයක් ගන්නා ලද්දේ කොවිඩ්-19 වෛරසය ව්‍යාපත වීම වැලැක්වීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ගයන් වශයෙනි.[4] මේ අතර පාර්ලිමේන්තු මහ මැතිවරණය සම්බන්ධයෙන් වන ''හදිසි ක්‍රියාමාර්ගයන්'' සාකච්ජා කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයින් ද මහජන සෞඛ්‍ය නිලධාරීන් හමුවිය.[5]

නාම යෝජනා භාරගැනීම 2020 මාර්තු මස 19 වන දින අවසන් වීමත් සමගම පාර්ලිමේන්තු මහ මැතිවරණය කල් දමන බව මැතිවරණ කොමිසම විසින් දැනුම් දෙන ලදි.

**<u>ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මහ මැතිවරණය පිළිබඳ වර්තමාන තත්ත්වය</u>**

---

[1] 2020 මාර්තු 02 වන දිනැති අංක 2165/8 දරණ (අතිවිශේෂ) ගැසට් පත්‍රය www.presidentsoffice.gov.lk/wp-content/uploads/2020/02/2165-08_E.pdf වෙබ් අඩවිය ඔස්සේ ලබාගත හැක.

[2] සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයෙහි වසංගත රෝග අංශය, කොරෝනා වෛරස් රෝගය පිළිබඳ තත්ත්ව වාර්ථාව 2019 (කොවිඩ්-19) 2020.03.19
http://www.epid.gov.lk/web/images/pdf/corona_virus_report/sitrep-sl- en-19-03_10.pdf

[3] Newswire.lk, ''ජනතාවගේ ආරක්ෂඩ්'' 'ප්‍රමුඛතා ගැටළු', මැතිවරණය කල දැමීම, දෙමළ ජාතික සංධානය
http://www.newswire.lk/2020/03/16/safety-of-public-of-paramount-concern-postpone-election-tna/ ;
මැතිවරණය ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය විසින් 2020 පාර්ලිමේන්තු මහ මැතිවරණය කල් දමන ලෙස ඉල්ලා සිටී.
https://cmev.org/2020/03/17/cmev-calls-for-postponement-of-general-election-2020/

[4] ජනාධිපති මාධ්‍ය අංශය, ''කොවිඩ්-19 පැතිරීම වලක්වාලීම සඳහා තවදුරටත් තීරණ''
http://www.pmdnews.lk/more- decision-to-contain-covid-19-outbreak/

[5] මංජුල ප්‍රනාන්දු ''මැ.කො, සහ සෞඛ්‍ය අමාත්‍යාංශය එක්ව, හදිසි පියවර පිළිබඳව හෙට දින තිරණය කරයි''.
http://www.sundayobserver.lk/2020/03/15/news/ec-health-ministry-decide-contingency-measures-tomorrow

පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 24(1) වගන්තිය යටතේ මැතිවරණ කොට්ඨාස 22 සඳහා තරගයක් පවත්වනු ලබන බවට නිල වශයෙන් දැනුම් දෙමින් මැතිවරණ කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයක් නිකුත් කරන ලදි.[6]

කෙසේ නමුත්, 2020 මාර්තු 21 දිනැති තවත් ගැසට් පත්‍රයක් මඟින් මැතිවරණ කොමිසන් සභාව මඟින් මහජනතාවට දන්වා සිටින ලද්දේ ශ්‍රී ලංකාව තුල කොවිඩ්-19 වෛරසයේ පැතිරී යමේ ව්‍යසන තත්ත්වය හේතුවෙන් අදාළ මැතිවරණ කොට්ඨාස 22 තුළ ඡන්ද විමසීම 2020 අප්‍රෙල් මස 25 වන දින පැවැත්වීමට නොහැකි බවය.[7] එකී නිවේදනය මඟින් තවදුරටත් තහවුරු කරන ලද්දේ, ඡන්ද විමසීමේ දිනය වර්ෂ 2020 මැයි මස 14 වන දිනෙන් පසුව දිනයක් මැතිවරණ කොමිසම විසින් නියම කරනු ලැබෙනු ඇති බවත් ''එම දිනය පසුව නිකුත් කරනු ලබන ගැසැට් නිවේදනයක් මඟින් ප්‍රසිද්ධ කරනු ලබන බවත්ය''.[8]

එසේ හෙයින්, පාර්ලිමේන්තුව විසුරුවා හැර ඇති ස්වභාවයෙන්ම පවතින අතර පාර්ලිමේන්තු මැතිවරණය කිනම් දිනක පැවැත්වෙනු ඇත්ද යන්න පිළිබඳව මේ වන විට නිශ්චිතභාවයක් නොමැත.

නාම යෝජනා භාරදීමේ කාල පාරාසය අවසන් වී ඇති අතර, ඒ ඒ මැතිවරණ කොට්ඨාශයන් සඳහා දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් විසින් නම් කරන ලද අපේක්ෂකයින්ගේ නම් මේ වන තෙක් පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 24(1) (ආ) වගන්තිය ප්‍රකාරව ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර නොමැත.

එමෙන්ම, ජනාධිපතිවරයා විසින් මැතිවරණය ප්‍රකාශයට පත් කිරීමේ ස්වකීය නිවේදනය තුළින් නව පාර්ලිමේන්තුව රැස්වීම 2020 මස 14 දිනට නියම කර තිබෙන මුත්, එලෙස එදිනට රැස්වීම සඳහා පාර්ලිමේන්තුව පවතින්නේ නැත.

<u>පාර්ලිමේන්තු මැතිවරණය කල් දැමීමේ නෛතික ප්‍රතිවිපාක</u>

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70(1) අනු ව්‍යවස්ථාව ප්‍රකාරව, පාර්ලිමේන්තුවේ ප්‍රථම රැස්වීම සඳහා නියම කල දිනයේ සිට අවුරුදු හතරක් සහ මාස හයක කාලයක් අවසන් වන දිනට පසු ඕනෑම අවස්ථාවක පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලය ජනාධිපතිවරයා සතු වේ. ඉහතින් සඳහන් කල පරිදි වර්ෂ 2020 මාර්තු මස 02 වන දිනැති ගැසට් නිවේදනය මඟින් පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට ජනාධිපතිවරයා විසින් භාවිතා කරන ලද්දේ මෙකී බලයයි. ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හරිනු නොලැබුවේ නම්, පාර්ලිමේන්තුව වර්ෂ 2020 සැප්තැම්බර් මස 01 වන දින දක්වා ක්‍රියාත්මක වීමට නියමිතව තිබුණි.[9]

පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 24(3) වගන්තිය ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවැරී ඇති බලතල මැතිවරණ කොට්ඨාස 22ක සඳහා පැවැත්වීමට නියමිතව තිබූ පාර්ලිමේන්තු මැතිවරණය කල් දැමීමට භාවිතා කරන ලදි. එකී පනත අනුව ගත් කල, ඉහත කී බලය මැතිවරණ කොමිෂමට භාවිතා කල හැක්කේ පනතේ 24(1) වගන්තිය ප්‍රකාරව අදාළ මැතිවරණය තරඟයක් වශයෙන් පැවැත් වෙන බවට ප්‍රකාශයක් නිකුත් කිරීමෙන් පසුව පමණි.[10]

---

[6] අංක 2167/12, 2020 මාර්තු 20 දිනැති ගැසට් (අති විශේෂ) නිවේදනය http://www.documents.gov.lk/files/egz/2020/3/2167-12_E.pdf

[7] අංක 2167/19, 2020 මාර්තු 21 දිනැති ගැසට් (අති විශේෂ) නිවේදනය http://www.documents.gov.lk/files/egz/2020/3/2167-19_E.pdf

[8] ඉහත එම (ii) වන ඡේදය

[9] ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 62(2) අනු ව්‍යවස්ථාව

[10] එය 2020 මාර්තු මස දින කරන ලදි. ඉහත අංක 6 පාද සටහන බලන්න.

මැතිවරණ කොමිෂන් සභාව විසින් පාර්ලිමේන්තු මැතිවරණය කල් දැමීමේ නියෝගය නිකුත් කිරීමේ අවස්ථාව වන තෙක්ම, වර්ෂ 2020 මාර්තු 02 වන දින නිකුත් කල ගැසට් නිවේදනය නැවත කැඳවීමට ජනාධිපතිවරයා සතු හැකියාව වලක්වන කිසිදු ප්‍රතිපාදනයක් හෝ බාධාවක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ පාර්ලිමේන්තු මැතිවරණ පනත තුළ නොතිබිණි. සාධරණ ලෙස ක්‍රියා කිරීමේ බැඳියාව ජනාධිපතිවරයාට ඇති අතර එවැනි ගැසට් නිවේදනයක් අත්තනෝමතික ලෙස ආපසු කැඳවීමේ බලයක් නොමැත.[11] කෙසේ නමුත්, වර්තමානයෙහි පවතින සිද්ධිමය සාධක අනුව ගත් කළ එකී ගැසට් නිවේදනය ආපසු කැඳවීමක් සිදු කළේ නම්, ඔහුගේ එකී ක්‍රියාව පූර්ණ වශයෙන්ම සාධාරණීකරණය වන්නා සේම එය අත්තනෝමතික ක්‍රියාවක් බවට හුවා දැක්වෙන චෝදනා එල්ල වීමේ කිසිදු ඉඩකඩක් නොතිබෙන්නට ඇත. එකී ආපසු කැඳවීම සිදු වුයේ නම් එමගින් පාර්ලිමේන්තුව විසුරුවා හැරීම ආපසස්සට හැරවීමක් වීමට ඉඩ තිබුණි.

කොවිඩ්-19 වෛරස වසංගතය සහිත පසුබිමක මැතිවරණය පැවැත් වුයේ නම් උද්ගත වීමට තිබු අතිශය විනාශකාරී ප්‍රතිවිපාක හේතුවෙන් පාර්ලිමේන්තු මැතිවරණය කල් දැමීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව ගත් තිරණය අගය කරනු ලැබේ.

කෙසේ නමුත්, මැතිවරණ කොමිෂන් සභාව විසින් පාර්ලිමේන්තු මැතිවරණය කල් දැමීමත් සමඟම උත්ගතව ඇති ගැටළු ගණනාවක් පහතින් සාකච්ජාවට බඳුන් කර තිබේ.

1. මැතිවරණ ප්‍රචාරණ ව්‍යාපාරය

පාර්ලිමේන්තු මැතිවරණ පනත මඟින් තහනම් කර නොමැති ක්‍රියාකාරකම් ඔස්සේ මැතිවරණ ප්‍රචාරණ ව්‍යාපාරයන්ට අදාළ කටයුතු කරගෙන යෑම සම්බන්ධයෙන් සෘජු බලපෑමක් මැතිවරණය කල් දැමීම සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාව ගත් තීරණය තුලින් සිදු නොවේ. මේ හේතුවෙන් මැතිවරණ අපේක්ෂකයින් ස්වකීය ප්‍රචාරණ කටයුතු සිදු කිරීමේ ඉඩකඩක් පැවැති අතර එතුලින් ඔවුන් කොවිඩ්-19 වෛරසය ව්‍යාප්ත කරවන වාහකයින් වීමට සහ එමඟින් මහජනතාවට දැඩි අවධානමකට පත් කරන්නටද ඉඩ තිබුණි.

මෙකී අවදානම් සහගත තත්ත්වය අවම කිරීම උදෙසා මැතිවරණ කොමිසම විසින් එම අපේක්ෂකයින් සඳහා ලබාදෙන අනුක්‍රමික අංක සහ අපේක්ෂකයින්ගේ නම් ලැයිස්තුව ප්‍රසිද්ධියට පත් කරන ගැසට් නිවේදනය නිකුත් නොකිරීමට මැතිවරණ කොමිසම ක්‍රියා කරන ලදි. මැතිවරණ කොමිසම විසින් නිකුත් කල අපේක්ෂක අනුක්‍රමික අංක නොමැතිව අපේක්ෂකයෙකුට ඉතා සීමිත වපසරියක පමණක් ස්වකීය මැතිවරණ ප්‍රචාරණ කටයුතු කිරීමට සිදු වේ.

එපමණක් නොව, 'ඇඳිරි නීතිමය' තත්ත්වයක් ප්‍රකාශයට පත් නොකලද, කොවිඩ්-19 වෛරසය ව්‍යාපත් වීම සිදුවන අන්දමේ ප්‍රසිද්ධ මැතිවරණ ප්‍රචාරණ හා මැතිවරණ රැස්වීම් වලක්වාලීම සඳහා ප්‍රමාණවත් නෛතික ප්‍රතිපාදන පොලිස් ආඥාපනතේ සහ අපරාධ නඩු විධාන සංග්‍රහය ආශ්‍රිතව භාවිතා කිරීමට හැකිය.[12]

2. පාර්ලිමේන්තුව විසුරුවා හැරීම

[11] **රාජවරෝතියම් සම්පන්තන් සහ තවත් අය එදිරිව නීතිපති සහ තවත් අය, SC FR 351-356/2018, SC FR 358-361/2018**.

[12] පොලිස් ආඥා පනතේ 77 සිට 81 දක්වා වගන්ති බලන්න, අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 106 වගන්තිය.

මැතිවරණය කල් දැමීමේ බලය පමණක් මැතිවරණ කොමිෂන් සභාවට ඇත. එකී නියෝගය මගින් ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හරිමින් නිකුත් කළ නියෝගය ආපසු හැරවීමක් සිදු නොවේ. ඒ අනුව මෙම අවස්ථාව වන විට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 වන ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව විසුරුවා හැර තිබෙන අතර මැතිවරණය පැවැත්වෙන හෝ නව පාර්ලිමේන්තුව රැස්වන දිනයක් පිළිබඳව පැහැදිලි අර්ථ දැක්වීමක් නොමැත. මෙම තත්ත්වය මගින් නෛතිකමය අභියෝගයන් කීපයක් උද්ගත කෙරේ.

## I. ජනතාවගේ පරමාධිපත්‍ය බලය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන ව්‍යවස්ථා ප්‍රකාරව ජනතාවගේ පරමාධිපත්‍ය බලය යන්නට ආණ්ඩුවේ බලය, මූලක අයිතිවාසිකම් සහ ඡන්ද බලය අයත් වේ. ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය භාවිතා කිරීමේ ප්‍රමුඛතම මෙවලම වශයෙන් ජනතා ඡන්දයෙන් තෝරා පත්කර ගන්නා මහජන නියෝජිතයින්ගෙන් සැදුම් ලත් පාර්ලිමේන්තුව ක්‍රියා කරයි.

ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දු මගින් අවස්ථා ගණනාවකදීම තහවුරු කර ඇත්තේ නිසි දිනට මැතිවරණ පැවැත්වීමට අපොහොසත් වීම හෝ මැතිවරණ කල් දැමීම වු කලී ජනතාවගේ ඡන්ද අයිතිය මෙන්ම මූලික අයිතිවාසිකම් ද උල්ලංඝණය කිරීමක් බවයි.[13] වර්තමානයේ පවතින තත්ත්වය හේතුවෙන් මැතිවරණය කල් දැමීම සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාවට ඉතා සීමිත විකල්ප අවස්ථාවන් පැවැති මුත් එමගින් පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් ලඝුකොට සැලකීමක් සිදුව තිබේ. ජනාධිපතිවරයා විසින් 2020 මාර්තු 02 වන දින පාර්ලිමේන්තුව විසුරුවා හරිමින් නිකුත් කරන ලද ගැසට් නිවේදනය ඉවත් කරනු ලැබුවේ නම් (පාර්ලිමේන්තු මැතිවරණය කල් දැමීමේ තීරණය ගැනීම සඳහා මැතිවරණ කොමිසම යොමු නොකර) එහිදි පාර්ලිමේන්තුව පැවැති පරිදිම යළිත් වර්ෂ 2020 අගොස්තු මස අවසානය දක්වා ක්‍රියාත්මක වීමට හැකියාව තිබූ බැවින් එහිදී ජනතාවගේ ඡන්ද අයිතිය උල්ලංඝණය වීමක් සිදු නොවන්නට තිබුණි.

ක්‍රියාකාරී පාර්ලිමේන්තුවක් නොපැවතීම මගින් ජනතාවගේ පරමාධිපත්‍ය බලය අවමානයට ලක්වීමක් සේම එතුලින් රාජ්‍ය පාලනය සම්බන්ධයෙන් උද්ගත වන තවත් බරපතල ප්‍රශ්න ගණනාවක්ම උද්ගත කරයි.

## II. රාජ්‍ය මුල්‍ය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148[14] ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය මුලය සම්බන්ධයෙන් වන පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතුය. ආණ්ඩුවේ ආදායම/ලැබීම් සහ ආණ්ඩුවේ වියදම් ද ඇතුළුව අනෙකුත් සියලු කාරණා සම්බන්ධයෙන් වන මෙකී පාලන බලයෙහි සවිස්තරාතමක පැහැදිලි කිරීම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 සිට 152 දක්වා වු ව්‍යවස්ථාවන් මගින් පෙන්වා දෙනු ලැබේ.

ශ්‍රේෂ්ඨාධිකරණය ලබාදුන් තීන්දු ගණනාවක්ම[15] නිශ්චිත වශයෙන්ම නිගමනය කර තිබෙන්නේ

---

[13] **කරුණාතිලක එදිරිව. දායනන්ද දිසානායක (1999) 1 S.L.R. 157, මොහොමට් හුසෙන් හජ්ජියාර් මොහොමඩ් සහ තවත් අය එදිරිව ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව සහ තවත් අය**

[14] "රාජ්‍ය මුල්‍ය සම්බන්ධයෙන් පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතුව පැවැතිය යුතුය. පාර්ලිමේන්තුව මගින් සම්මත කරන ලද හෝ පවතින වෙනත් නීතියක් යටතේ හැර කිසිදු පළාත් පාලන අධිකාරීත්වයකට හෝ වෙනත් රජය අධිකාරී ආයතනයකට බදු, වරිපනම්, වෙනත් විශේෂිත බදු ආදී කිසිවක් පැනවීමේ හැකියාව නොමැත."

[15] **ශ්‍රේෂ්ඨාධිකරණය විශේෂ විනිශ්චය 3 සහ 4/2008 (විසරජන පනත් කෙටුම්පත් පිළිබඳ නඩුකරය) ශ්‍රේෂ්ඨාධිකරණ විශේෂ විනිශ්චය 28 සහ 29 /2016 මුල්‍ය කළමණාකරණ (වගකීම්) (සංශෝධන) පනත් කෙටුම්පත් පිළිබඳ නඩුකරය** බලන්න

Centre for Policy Alternatives (Guarantee) Limited | 6/5, Layards Road, Colombo 5, Sri Lanka
Tel: ++94112081384, +94112081385, +94112081386 | Fax: +9411 2081388 | Email: info@cpalanka.org | Web: www.cpalanka.org

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථා ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය සම්බන්ධයෙන් වන සියලු කරුණු කෙරේ පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතුව පැවැතීම අනිවාර්ය අංගයක් බවයි. ඒ අනුව පාර්ලිමේන්තුව සතුව පූර්ණ පාලනය පවතීය යනුවෙන් අදහස් කරනු ලබන්නේ කුමක් ද යන්න ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පැහැදිලි කරමින් ප්‍රකාශ කර ඇත්තේ:

(i) මුදල් මූලාශ්‍ර පිළිබඳව පාලනය, වෙනත් ආකාරයකින් පැහැදිලි කරන්නේ නම්, බදු, අය කිරීම්, ගාස්තු ආදිය සහ ජනරජයේ ණය පිළිබඳ තත්ත්වය

(ii) අණ්ඩුවේ ආයතන දෙපාර්තමේන්තු සඳහා රාජ්‍ය මූල්‍ය වෙන්කිරීම හා ඒවායේ වියදම් සීමා පැනවීම ඔස්සේ පාලනය කිරීම සහ,

(iii) ඉහත (i) හා (ii) යන කාරණු වලට අනුකූලව කටයුතු කරන්නේ ද යන්න ගැන නිරන්තර විගණන මඟින් පරීක්ෂා කිරීම ඔස්සේ පාලනය

මෙහිදී ඉතා වැදගත් කාරණය වන්නේ මෙවන් පාලනයක් පාර්ලිමේන්තුව සතු වීමේ වැදගත්කම කුමක්ද යන්න පිළිබඳව හේතු දැක්වීමක් ශ්‍රේෂ්ඨාධිකරණය ස්වකිය තීන්දු වලදී ලබා දී තිබීමයි. මූලික වශයෙන්ම රාජ්‍ය මූල්‍ය පිළිබඳව පාර්ලිමේන්තුවෙහි පාලනය යනු විධායකයෙහි කටයුතු පරීක්ෂා කිරීම පිළිබඳව පාර්ලිමේන්තුවේ කාර්ය කර්තව්‍යයන් අතරින් එක් අංගයකි. දෙවනුව පාර්ලිමේන්තුව විසින් මෙකී බලය භාවිතා කරනු ලබන්නේ තමන්ගේ යහපත පිණිස නොව එය මහජනතාව සඳහා වන ''භාරයක්'' වශයෙන්ය යන්න සහතික කිරීම සඳහා එය පාලනය කිරීම පාර්ලිමේන්තුවේ යුතුකමක් ද වේ.

ඉහත කී අන්දමේ පාලනයක් වඩාත් විනිවිදභාවයකින් යුක්තව සිදු කිරීමට වඩාත් සුදුසුම ස්ථානය සාකච්ඡා කිරීම සඳහාම සැදුම්ලත් මන්ත්‍රණ සභාවක් වශයෙන් පවතින පාර්ලිමේන්තුව තුල බව නොකිවමනාය. පාර්ලිමේන්තුව තුල සිදුවන කටයුතු ප්‍රසිද්ධ කරනු ලබන්නා සේම ඒවා වාර්තාගත වීම පිළබඳ කරුණකි. පාර්ලිමේන්තුව මගින් සම්මත කරනු ලබන පනත් කෙටුම්පත්, යොජනා ආදිය ද ප්‍රසිද්ධ ලේඛන බවට පත් වේ. පාර්ලිමේන්තුව තුල ආණුඩු පක්ෂයේ සහ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ප්‍රශ්න මතු කිරීමට, ප්‍රකාශ නිකුත් කිරීමට සහ වාදවිවාද සඳහා දායක වීම උදෙසා භාෂණයේ නිදහස තිබේ. එබැවින් රාජ්‍ය මූල්‍ය පිළිබඳ කටයුතු පාර්ලිමේන්තු බලාධිකාරයෙන් ඔබ්බට විතැන් කර විධායකය වෙත නියාමනය නොකළ පාලන බලයක් සහිතව භාරදීම ඉතා පැහැදිලි වශයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි වනවා පමණක් නොව එය මහජන යහපතටද එරෙහි වීමකි. කෙසේ නමුත්, මෙකී රීතියට එක් වැදගත් ව්‍යාතිරේකයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150(3) අනු ව්‍යවස්ථාවෙහි අන්තර්ගත වේ.[16]

''යම්කිසි වර්ෂයක විසර්ජන පනත් කෙටුම්පත නීතිය බවට පත්වීමට හෝ ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබූ අවස්ථාවක පාර්ලිමේන්තුව විසින් රජයේ සේවාවන් සඳහා මුදල් වෙන්කර නොමැත්තේ නම් අභිනව පාර්ලිමේන්තු රැස්වීමට නියමිත දින සිට මාස තුනක් ඉකුත් වන තෙක් රජයේ සේවාවන් සඳහා යමකිසි මුදලක් අවශ්‍ය වෙතැයි ජනාධිපතිවරයා සලකයි නම් ඒ මුදල එකාබද්ධ අරමුදලෙන් නිකුත් කිරීමටත් වැය කිරීමටත් ජනාධිපතිවරයාට බලය ඇත්තේය.''
ඉහත කී ප්‍රතිපාදනය විශ්ලේෂණය කිරීමේදී පෙන්නුම් කෙරෙන්නේ එකී සුවිශේෂී තත්ත්වයකට අදාළ බවය. එනම් එකී තත්ත්වය අදාළ වන්නේ:

(i) පාර්ලිමේන්තුව විසුරුවා හැරීමෙන් පසුව හා අභිනව පාර්ලිමේන්තුව ආරම්භ වන කාලය සඳහා වන වියදම් වෙනුවෙන් පාර්ලිමෙන්තුව කිසිදු ප්‍රතිපාදනයක් වෙන් කර නොමැති

16 මැතිවරණ සම්බන්ධයෙන් අඳාල වන වියදම් පිළිබඳ ප්‍රතිපාදන ඇති 150 (4) ව්‍යවස්ථාවද බලන්න ''ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හැර මහ මැතිවරණයක් සඳහා දිනයක් හෝ දින නියම කරන අවස්ථාවක ඒ **මැතිවරණය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් ප්‍රතිපාදන සලසා නොමැති නම්** ඒ සඳහා අරමුදල් එකාබද්ධ අරමුදලින් නිකුත් කිරීමටත් ජනාධිපතිවරයාට බලය ඇත්තේය.''

තත්ත්වයක්දී;

(ii) ''රජයේ සේවාවන් සඳහා අවශ්‍ය'' ප්‍රමාණයට පමණක් ප්‍රතිපාදන ඒකාබද්ධ අරමුදලින් වෙන් කිරීමේ හැකියාව ජනාධිපතිවරයා සතු වේ;

(iii) මෙකී ප්‍රතිපාදන වෙන්කිරීම යම් සීමිත කාල පාරාසයකට මිස අසීමිත කාලයකට සිදු කළ නොහැක

ආදී වශයෙන් වූ අවස්ථාවන් හීදී පමණි.

වර්ෂ 2019 නොවැම්බර් මස පැවැත් වූ ජනාධිපතිවරණයෙන් පසුව පත් වූ නව ආණ්ඩුව විසින් අයවැයක් ඉදිරිපත් නොකරන ලදි. ඒ වෙනුවට, වර්ෂ 2020 ජනවාරි මස 01 වන දින සිට 2020 අප්‍රේල් මස 30 වන දින දක්වා හෝ වර්ෂ 2020 සඳහා විසර්ජන පනත ඉදිරිපත් කරනු ලබන දින දක්වා යන මෙයින් කලින් එළඹෙන කාරණයට අදාළ දිනය දක්වා බලපැවැත්වෙන පරිදි අතුරු සම්මත ගිණුමක් වර්ෂ 2019 ඔක්තොම්බර් 23 වන දින පාර්ලිමේන්තුවේ දී සම්මත කර ගන්නා ලදි.[17] පාර්ලිමේන්තුව විසුරුවා හැර ඇති පසුබිමක් තුල වර්ෂ 2020 අප්‍රේල් මස විසරජන පනත සම්මත කිරීමේ කිසිදු ඉඩකඩක් නොමැති අතර එසේ හෙයින්ම 2020 අප්‍රේල් මස 30 වන දින යනු අතුරු සම්මත ගිණුම හරහා පාර්ලිමේන්තුව මගින් මූල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීමේ කාල පරාසය ද අවසන් වන දිනයයි. එසේ හෙයින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150(3) ව්‍යවස්ථා ප්‍රකාරව ජනාධිපතිවරයාගේ බලය ක්‍රියාවට නැංවීම සිදු විය හැක්කේ 2020 අප්‍රේල් මස 30 වන දිනෙන් පසුවය.[18]

ජනාධිපතිවරයාට එවැනි මුදල් ප්‍රතිපාදන වෙන් කිරීමේ හැකියාව ඇති කාලය සීමිත වන්නේ ''අභිනව පාර්ලිමේනිතුව රැස්වීමට නියමිත දිනයේ සිට මාස තුනක කාලයක් දක්වා'' පමණි. මේ අවස්ථාව වන විට ජනාධිපතිවරයා විසින් වර්ෂ 2020 මාර්තු මස 02 වන දින නිකුත් කල ගැසට් නිවේදනය වලංගුව සහ ක්‍රියාත්මකව පවතී. එසේ හෙයින්, 2020 අගෝස්තු මස 14 වන දින තෙක් (වෙනත් ආකාරයකින් සඳහන් කරන්නේ නම්, අභිනව පාර්ලිමේන්තුව රැස්වීමට නියම කර ඇති දින සිට මාස 03ක කාලයක්) ''රජයේ සේවාවන් සඳහා අවශ්‍ය'' මුදල් පමණක් ගෙවීමේ හැකියාව ජනාධිපතිවරයාට ඇත. ඒ අනුව, ඊට පෙර පාර්ලිමේන්තු මැතිවරණය සිදුවිය යුතුව ඇති සේම, 2020 අගෝස්තු 14 වන දිනට යෙදී ඇති කාලය ඉකුත් වීමේ සීමාවට පෙර විසර්ජන පනත පාර්ලිමේන්තුව තුල සම්මත කර ගැනීමද කල යුතුව තිබෙන මුත් එය ප්‍රයෝගිකව ක්‍රියාත්මක කල නොහැකි කාල සීමාවක් බව පෙනී යයි.

ඒ අනුව බලන කල, 150(3) ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා සතු බලතල කාලය යන සාධකය යටතේ සීමා කෙරී ඇති සේම එහි වපසරිය අනුවද සීමා වී ඇත්තේ අදාළ වියදම් ''රජයේ සේවාවන් සඳහා අවශ්‍ය වන තරමට පමණක්'' යන තත්ත්වය හේතුවෙනි. ''රාජ්‍ය සේවාවන් සඳහා අවශ්‍ය'' යන්න නිර්වචනය කර නොමැති මුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුලින් පැහැදිලිව අදහස් කෙරෙනුයේ පාර්ලිමේන්තුව මගින් සම්පූර්ණ ප්‍රතිපාදන අයවැය සම්මත කිරීමක් හරහා යාම සඳහා අත්‍යාවශ්‍ය වියදම් පමණක් යන්නය. තවද, දේශීය සහ විදේශීය ණය ගණන් පිළිබඳව ඇති නීති ගණනාවක් ද ආණ්ඩුවට බලපා තිබේ.[19] මෙකී ණය ගණන් වෙනස් කල හැක්කේ පාර්ලිමේන්තුවේ වෙනත් පනතක් මගින් පමණකි.

මෙකී මූල්‍ය දුෂ්කරතා විසඳාලීම උදෙසා ජනාධිපතිවරයාට උපකාරී විය හැකි යාන්ත්‍රණයන් කීපයක් අණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ අන්තර්ගත බව සිහි තබා ගත යුතුය. ඒ අතුරින් වඩාත් පැහැදිලිම

---

[17] See https://www.parliament.lk/files/documents_news/2019/vote-on-account/resolution.pdf

[18] **ශ්‍රේෂ්ඨාධිකරණයේ විශේෂ විනිශ්චය 30, 31, 32, සහ 33/2016 අගය එකතු කළ බදු (සංශෝධන) පනත් කෙටුම්පත නඩුකරය** මෙකී ප්‍රතිපාදනයන්ගේ සුවිශේෂී ස්භාවය පිළිබඳව සලකා බලන විට, මුදල් සම්බන්ධයෙන් පනත් කෙටුම්පත් සහ/හෝ යෝජනාවක් සම්මත කිරීම සඳහා තිබෙන කාර්ය පටිපාටිය ඉතා දැඩිව අනුගමනය කල යුතු වෙය යන්න අධිකරණයෙහි මතය විය. අධිකරණයෙහි දැඩි අර්ථනිරූපණය සාධාරණීයකරණය කිරීම උදෙසා ''......ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදන උල්ලංඝණය නොකරණ බවට තහවුරු කිරීම සහ ආණ්ඩුවේ ඒ ඒ අංශ වෙත පවරා ඇති බලතල ආරක්ෂා කර දීම මෙම අධිකරණයෙහි වැදගත්ම කාර්යය වේ ......''

[19] 2019 විසරජන පනත සහ සක්‍රිය ණය කළමණාකරණ පනත බලන්න

යාන්ත්‍රනය වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70(7) ව්‍යවස්ථා ප්‍රකාරව දැනට උද්ගතව ඇති හදිසි තත්ත්වය සලකා බලා නැවත පාර්ලිමේන්තුව කැඳවීමය.[20] පාර්ලිමේන්තුව කැඳවනු ලබන අවස්ථාවක දී, කොවිඩ්-19 වසංගත තත්ත්වය කළමණාකරණය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අනුමත කිරීම සිදු කල හැකිය. මෙමගින් උත්ගතව ඇති අර්බුදකාරී තත්ත්වයට අදාළව අරමුදල් රැස්කිරීම සහ වියදම් කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය විනිවිදභාවය ද තහවුරු කර ගත හැකිය. පවතින වර්තමාන සන්දර්භය තුල විශේෂයෙන්ම මෙම අර්බුදකාරී තත්ත්වයෙහි බරපතලභාවය සහ පැවැත්වීමට නියමිත මැතිවරණය පිළිබඳ සැළකිමේදී, මෙකී වෛරසයෙහි ව්‍යාපත්තිය මැඩපැවත්වීම සඳහා අණ්ඩුවට අවශ්‍ය මුල්‍ය ප්‍රතිපාදන ලබාදීම ප්‍රතික්ෂේප කිරීම කිසිදු දේශපාලන පක්ෂයකින් සිදු නොවනු ඇත.

70(7) ව්‍යවස්ථාව මත පිහිටා කටයුතු කිරීමේ වැදගත්කම වන්නේ, එසේ කැඳවනු ලැබූ පාර්ලිමේන්තුව හදිසි අවස්ථාව අවසන්වීම හෝ මැතිවරණ කොමිෂන් මගින් තීරණය කරනු ලබන දිනයක පාර්ලිමේන්තු මහ මැතිවරණය අවසන්වීම යන මෙයින් කලින් එළැබෙන අවස්ථාවකදී විසිරෙන්නේය යන තත්ත්වයයි. මෙ තුලින් පාර්ලිමේන්තු මහ මැතිවරණය අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව පැවැත්වීමේ වගකීම තහවුරු වීමක්ද සිදු වේ.

### III. මහජන හදිසි අවස්ථා සම්බන්ධයෙන් වන විශේෂ බලතල

ශ්‍රී ලංකාව තුල කොවිඩ්-19 වෛරස් වසංගත තත්ත්වය පැතිරීම වලක්වාලීම සඳහා අණ්ඩුව විසින් පසුගිය සති දෙකක කාලය තුල විවිධාකාර පියවරයන් ගෙන තිබේ. එකී පියවරයන් අතරට

- විශේෂයෙන්ම මෙකී වෛරසයට නිරාවරණය වී ඇති බවට සැක කරනු ලබන පුද්ගලයින් ඔවුන්ගේ නිවාස තුල සහ ආණ්ඩුව විසින් පහසුකම් සපයා ඇති මධ්‍යස්ථාන තුල නිරෝධායනය කිරීම.
- සමහර විදේශ රටවල් වල සිට ශ්‍රී ලංකාවට පැමිණි පුද්ගලයින්ට සෞඛ්‍ය නිළධාරීන් වෙත ගොස් ලියාපදිංචි වන ලෙසට ඉල්ලීම් කිරීම සහ එලෙස ලියාපදිංචි වී නොමැති පුද්ගලයින්ව සොයා මෙහෙයුම් කිරීම.
- විශාල වශයෙන් පුද්ගලයින් එක්රැස් වීම වැලැක්වීම උදෙසා රජයේ නිවාඩු සහ වෙනත් නිවාඩු දින ප්‍රකාශයට පත් කිරීම
- රටේ ප්‍රදේශ ගණනාවක අඳිරි නීතිය පැනවීම.
- පුරවැසියන් සඳහා අත්‍යාවශය ආහාර හා වෙනත් ද්‍රව්‍ය ලබාදීම සඳහා සම්බන්ධීකරණ කටයුතු කිරීමේ යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීම. ආදිය ඇතුලත් වේ.

මෙකී සෑම පියවරයක්ම ගනු ලැබීම අවශ්‍ය වුයේ මෙම වෛරසය පැතිරයාම වලක්වාලීම සඳහා සහ මහජන සෞඛ්‍ය සුරක්ෂිත කිරීම සඳහාය. කෙසේ නමුත්, ආණ්ඩුව විසින් ගන්නා ලද සමහර තීරණයන් සඳහා පැහැදිලි නෛතික පසුබිමක් හා පදනමක් පැවැතියද[21] තවත් සමහර තීරණ සම්බන්ධයෙන් ඇති නෛතික පදනමක් නොමැතිව ආණ්ඩුව කෙටිකාලීන වශයෙන් ක්‍රියාත්මක විය හැකි වුවද එය දිගු කාලීන වශයෙන් ගැටළුකාරීය.[22]

---

[20] **පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබීමෙන් පසුව කවර අවස්ථාවක වුවද** පාර්ලිමෙන්තුව නියමිත දිනයට කලින් රැස්වීම අවශ්‍ය වන ස්වභාවයක **හදිසි තත්ත්වයක් උද්ගත වී ඇති බවට** ජනාධිපතිවරයා සෑහීමකට පත් වුවහොත් විසුරුවා හැර ඇති **පාර්ලිමේන්තුව ප්‍රකාශනයක් මඟින්**, ඒ ප්‍රකාශනයේ දින සිට තුන් දවසකට කලින් දිනයක් නොවිය යුතු දිනයක දී පාර්ලිමේන්තුව රැස්වන ලෙස කැඳවීමට ජනාධිපතිවරයාට බලය ඇත්තේය. **එසේ කැඳවනු ලැබූ පාර්ලිමේන්තුව හදිසි අවස්ථාවක අවසන් වීම හෝ මහ මැතිවරණය අවසන් වීම යන මෙයින් කලින් එළඹෙන අවස්ථාවක දී විසිරෙන්නේය.**

[21] නිරෝධායන සහ රෝග වැලැක්වීමේ ආඥා පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව යම් යම් පුද්ගලයින් නිරෝධායනය කිරීම සම්බන්ධයෙන් රෙගුලාසි පැනවීමේ බලය අමාත්‍යවරයා සතුය.

[22] මේ හේතුවෙන් උද්ගත වන ගැටළු ගණනාවක්ම පවතින අතර විශේෂයෙන්ම රාජ්‍ය නිලධාරීන් ද ඇතුළුව ආණ්ඩුව නියෝග පිළිනොපදින තැනැත්තන්ට විරුද්ධව නෛතික පියවර ගැනීමට ආණ්ඩුව කටයුතු කලහොත් සංකීරණ

විවිධාකාර ව්‍යසන තත්ත්වයන් කළමණාකරණය කිරීම සම්බන්ධයෙන් දශක ගණනාවක අත්දැකීම් පැවැතිය ද කොවිඩ්-19 වෛරසය පැතිරීමේ ව්‍යසනය හේතුවෙන් මනුෂ්‍ය ජීවිත, අයිතිවාසිකම්, ආණ්ඩු පාලනය සහ ආර්ථිකය යන ක්ෂේත්‍ර තුල උද්ගත කෙරෙන ප්‍රතිවිපාක හේතුවෙන් එය මෙතෙක් නොදුටු විරූ අන්දමේ අභියෝග ගණනාවක් ශ්‍රී ලංකා රජය ඉදිරියේද ඇති කර තිබේ. මෙම තත්ත්වය හේතුවෙන් ආණ්ඩුව විසින් අවම වශයෙන් වගකීමක් ඇති, විනිවිදභාවයෙන් යුක්ත සහ ඵලදායි පරිපාලන සහ තීරණ ගැනීමේ ව්‍යුහයන් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය ඇත. මෙකී අභියෝගයන්ගේ ඇති සුවිශේෂී ආවේණික ස්වභාවයන් හේතුවෙන්ම දැනට පවතින නෛතික රාමුව තුල ඉහත කී අන්දමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම අපහසු විය හැක.[23]

නව පාර්ලිමේන්තුවක් තෝරාපත් කර ගන්නා තෙක් එවැනි යාන්ත්‍රණයක් පිහිටුවීම ප්‍රමාද කිරීමේ හැකියාව අණ්ඩුවට නොමැත. එසේ හෙයින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70(7) වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව නැවත කැඳවීම කඩිනමින්ම සිදු කල යුතුය.

ප්‍රසිද්ධ නොවූ යම්යම් හේතු පදනම් කරගෙන පාර්ලිමේන්තුව නැවත කැඳවීමට ආණ්ඩුව විසින් අකමැත්තක් දක්වන බව පෙනේ. හදිසි අවස්ථාවන් කළමණාකරණය කිරීම සඳහාම වෙන් වූ නෛතික තත්ත්වයන් භාවිතා කිරීමට නොහැකි වීමද ඇතුළු කොවිඩ්-19 වෛරස් වසංගත තත්ත්වය පාලනය ඵලදායී ආකාරයට කිරීම උදෙසා භාවිතා කල හැකි මෙවලම් භාවිතා කිරීමට ඇති ඩඉකඩ අත්හැරීමක් පාර්ලිමේන්තුව නොකැඳවීම තුලින් ආණ්ඩුව විසින්ම සිදු කරයි.[24] මෙකී නීති මගින් හදිසි මහජන ව්‍යවසන තත්ත්වයක් කළමණාකරණය කිරීම සඳහා ආණ්ඩුව ඉතා පුළුල් අධිකාරි හා අභිමත බලයක් ලබාදෙන අතරම ඒ සම්බන්ධයෙන් අවම සුපරීක්ෂණයක් පමණක් ඇති අතර එහිදී ජනාධිපතිවරයා විසින් හදිසි තත්ත්වයක් සහ/හෝ ව්‍යසන තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීමෙන් පසු පාර්ලිමේන්තුවේ යම් සීමිත අධීක්‍ෂණයක් පමණක් අවශ්‍ය වේ.[25]

අපගේ ආණ්ඩුක්‍රම පටිපාටිය[26] සහ නීති ක්‍රමවේදයෙහි[27] පොදු ලක්ෂණයක් වන්නේ මෙවැනි හදිසි අවස්තාවන්හිදී විධායකයේ කාර්ය කර්තව්‍යයන් ඉටු කිරීමට සහය වීම සඳහා පාර්ලිමේන්තුව කැඳවීම සිදු කිරීමයි. සත්‍ය වශයෙන්ම, පාර්ලිමේන්තුවේ අධීක්‍ෂණයකින් තොරව ව්‍යසන තත්ත්වයන් සහ හදිසි අවස්ථාවන් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ වවෘත අධිකාරී බලයක අණ්ඩුවේ විධායකය වෙත ලබාදීම තුලින් එවැනි බලතල අයථා ලෙස භාවිතා කිරීමේ ඉඩකඩක් සහ අණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි අත්තනෝමතික ක්‍රියාවලට හේතුවක් විය හැකි බව පෙන්වා දීමට ශ්‍රේෂ්ඨාධිකරණයට සිදු විය.[28] ඒ අනුව ඉස්මතු කල හැකි තර්කය වන්නේ පවතින/ව්‍යවසන තත්ත්වයක් සඳහා ඵලදායි ලෙස ප්‍රතිචාර දැක්වීමේදී ආණ්ඩුවේ විවිධ අංශ ඒ වෙනුවෙන් කටයුතු කිරීම සහ එකී කාර්යයන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සහ නීතියේ ආධිපත්‍යයට ගරු කරමින් සිදුවන බව තහවුරු කිරීම සමස්ථයක් වශයෙන් ගත් කල අපගේ නීති ක්‍රමවේදයෙහි අවශ්‍යතාවයක් බවයි.

කවර තත්ත්වයක් යටතේ වුවද, විධායකය සම්බන්ධයෙන් පවතින අධීක්‍ෂණය එතරම්ම පුළුල් නොවන්නා සේම පවතින තත්ත්වයට ප්‍රතිචාර දැක්වීම සඳහා වඩාත් පුළුල් ඉඩප්‍රස්ථාවක් විධායකයට ලැබේ. පුළුල් බලතල ලබාදෙන පවතින නීතින් භාවිතා කිරීමෙන් ආණ්ඩුව වැලකී ඒ වෙනුවට පැහැදිලි ලෙසම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි සහ නීති විරෝධී යාන්ත්‍රණයන් ඔස්සේ කටයුතු කිරීමට

තත්ත්වයක් උද්ගත වේ.

23 නිදසුනක් වශයෙන් ගත් කල, බෝවන රෝග ආඥා පනත සහ නිරෝධායන හා රෝග වැලැක්වීමේ ආඥා පනත යන නීති ද්විත්වයම නිදහස ලැබීමට පෙර පැවැති වෙනස්ම සමාජ හා ආර්ථික පසුබිමක් යටතේ සැකසූ නීතින්ය.

24 මහජන ආරක්‍ෂක ආඥා පනත සහ අපදා කළමණාකරණ පනත බලන්න.

25 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 ව්‍යවස්ථාව බලන්න, මහජන ආරක්‍ෂක ආඥා පනතින් වගන්ති 2(3) 16 සහ 21 ශ්‍රී ලංකාවේ අපදා කළමණාකරණ පනතේ වගන්ති 10 සහ 11 බලන්න.

26 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 සහ 70(7) ව්‍යවස්ථාවන් බලන්න.

27 මහජන ආරක්‍ෂක ආඥා පනතේ 2(3) 16 සහ 21 වගන්තීන් ශ්‍රී ලංකාවේ ආපදා කළමණාකරණ පනතේ 10 සහ 11 වගන්තීන් බලන්න.

28 ශ්‍රේෂ්ඨාධිකරණයේ විශේෂ විනිශ්චය 04/2005(ශ්‍රී ලංකාවේ ආපදා කළමණාකරණ පනතේ කෙටුම්පත් නඩුකාරය) බලන්න

තෝරාගැනීම තෙරුම් ගත නොහැකි ප්‍රේහේලිකාවකි.[29]

එවැනි ක්‍රියා තුලින් හුදෙක් සිදු වන්නේ, මෙවැනි තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා ආණ්ඩුවට ඇති ධාරිතාවය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකුල පාලනයකට සහ නීතියේ ආධිපත්‍යයට ඇති කැපවීම සහ මහජන යහපත වෙනුවෙන් ආණ්ඩුවේ අධිකාරී බලය මෙහෙය වීමේ හැකියාව ආදී කරුණු සම්බන්ධයෙන් මහජන විශ්වාසය පහත වැටීමයි. එතුලින් අනවශ්‍ය නෛතික සංකීර්ණතවයන් මත ආණ්ඩුවේ කටයුතු අවුල් සහගත තත්ත්වයකට පත් කරන්නා සේම මහජන අවශ්‍යතාවයන් උදෙසා ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීමේ හැකියාවද හීන කරනු ලබයි.

[29] වර්ෂ 2020 මාර්තු 26 දිනැති අංක 2168/8 දරණ (අතිවිශේෂ) ගැසට් නිවේදනය http://www.documents.gov.lk/files/egz/2020/3/2168-08_E.pdf